දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ දුරුතු අව ජලවක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 40 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 පෙබරවාරි 01 සඳුදා

කොවිඩ් ව්‍යාප්තිය



කාලගුණයේ සිදුවීම් පොරවල අද පත්‍රය සමග

ජනතා යහපත සැලසෙන්න නව නීති සකස් කරන්න

රාජ්‍ය ආයතනවල නීති-රීති සකස් කිරීමේදී ජනතා යහපතට ඉවහල් වන අයුරින් නව නීති සැකසීමට සියවර ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් දී ඇත.

නව නීති-රීති ක්‍රියාත්මක කිරීමත් සමග පැරණි වක්‍රලේඛ යටතේ පවරා ඇති නඩු ඉල්ලා අස් කර ගන්නා ලෙසද ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් දී තිබේ. ජනතාවට සහන සැලසීමට හැකි වන අයුරින් රාජ්‍ය ආයතන ක්‍රියා කළ ආකාරය පිළිබඳ ද ජනාධිපතිවරයා මෙහිදී නිලධාරීන්ට කරුණු පැහැදිලි කළේය.

පිට 06

නැඟෙනහිර ජැටිය විකුණන්නේ නෑ

කොළඹ වරාය නැඟෙනහිර ජැටිය විකුණීමක් හෝ බදුදීමක් සිදු නොකරන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

වරායේ නැඟෙනහිර පර්යන්තයේ (ජැටිය) මෙහෙයුම් කටයුතු ඉන්දියාවේ සහ ජපානයේ සමාගම් දෙකකට ලබාදීමට යන බවට වෘත්තීය සමිති හා රට පුරා පවතින ආන්දෝලනය පිළිබඳ මාධ්‍යවේදියකු ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කාල්ටන් නිවසේදී ඊයේ (31) පැවසීය.

පිට 06

දේශපාලන පළි ගැනීම් විමර්ශන කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නඟන්න

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසමක්

CLICK

වසන් රිට අදාළ අත් විශේෂ පිට 06

රිය අනතුරු 3කින් 7ක් මරු තුරුලට

සේනානායක, රක්ෂණ ශ්‍රියන්ත, මුහ, නුවරඑළිය සමූහ - සී. මහගම සහ ටී.සී. ගුණසේකර, ඇල්පිටිය සමූහ

දවසින පුරා ප්‍රදේශ කිහිපයක ගත වූ පැය විසිදහතර තුළ සිදු වූ මාරක රිය අනතුරුවලින් 07 දෙනෙක් මියගොස් ඇත.

පිට 06

කොරෝනා සමයේදී බිලියන 80ක් ආධාර පිරිනැමුවා

අසේල කුරුළුවංශ

කොරෝනා සමයේදී පවුල් හැත්තෑදෙදාහක්ට ආධාර සැලසීම සඳහා රජය රුපියල් බිලියන 80 ක මුදලක් වැය කළ බවත් එය මහනුවර කොළඹ අධිවේගී මාර්ගය ඉදිකිරීමට යන මුදල මෙන් හරි අඩක් බවත් ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

පිට 06

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමානවත් 73 වැනි නිදහස් දින උත්සවය පෙබරවාරි 04 දිනට යෙදී ඇත. ඒ වෙනුවෙන් ඊයේ 31 කොළඹ 07 නිදහස් චතුරශ්‍ර පරිශ්‍රය අසල සියලු ආරක්ෂක සේවා පෙරහුරු පුහුණුවීම් කටයුතුවල යෙදී සිටි අයුරු ඡායාරූප ශිල්පී සමන් ශ්‍රී වෙදගේ ගේ කැමරා කාවයේ සටහන් වී තිබුණේ මෙසේය.

'නැඟෙනහිර ජැටිය' අද කැබිනට් අවධානයට

ධනුෂ්ක ගොඩකුඹුර

කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ විශේෂ අවධානය අද (01) යොමු කෙරෙනු ඇතැයි රජයේ ප්‍රකාශකයෙක් 'දිනමිණ'ට පැවසීය.

පිට 06

වරාය අත්‍යවශ්‍ය සේවාවක්

අතිවිශේෂ ගැසට් නිවේදනය නිකුත් වෙයි

පිට 06

පාස්කු දා ප්‍රහාරය ගැන සොයා බැලූ කොමිසමේ අවසන් වාර්තාව

පිට

අපරාධ සිවිල් සහ මුස්ලිම් නීති ප්‍රතිසංස්කරණයට අවධානය

රෝෂන් කුමාර

එක රටක් එක නීතියක් රජයේ සංකල්පය ක්‍රියාත්මක කිරීමේදී අපරාධ නීතිය, සිවිල් නීතිය මෙන්ම මුස්ලිම් නීතිය ප්‍රතිසංස්කරණය පිළිබඳවද අධිකරණ අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇති බව ඇමැති ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා පැවසීය.

පිට 06

හමුදාවට එන්නත් 31,000ක් ඉදිරි දින තුනේදී ලබා දෙනවා

සුභාෂිණී සේනානායක

ඉදිරි දින 3 තුළ යුද්ධ හමුදා සාමාජිකයන් අතර එන්නත් 31,000ක් ලබාදී අවසන් කිරීමට යුද්ධ හමුදා වෛද්‍ය කාණ්ඩයම අපේක්ෂා කරන බව කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථානය ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

පිට 06

වරායේ නැඟෙනහිර ජැටිය දෙනවාට ජවිපෙ විරෝධය අද

පිට 06

සත්වෝද්‍යාන අද සිට විවෘතයි

ඉදිරියේදී ඇති වන වයිරස් රෝග වළක්වන්න ආණ්ඩුව ක්‍රියා කළ යුතුයි

පිට 06

ස්වයං නිරෝධායන පුද්ගලයන් පරීක්ෂාවට වෙස්වළාගත් පොලිස් නිලධාරීන්